


**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## ලියා දන්වන වග

### ජාතික ආපදා සහ සංවේදිතාව

ශ්‍රී ලාංකිකයන් ඉතා සංවේදී හදවත් ඇත්තවුන් බව නැවත වරක් පසක් කර දුන්නේ පසුගියදා ඇති වූ මහා ගං වතුරයි. සිය සහෝදර ජනතාව අසරණව සිටියදී වහා ක්‍රියාත්මක වූ ඔවුන් රජයෙන් සියල්ල කෙරෙන තෙක් බලා නොසිට වහ වහා සංවිධානය වී ආපදා සහන සේවා ඇරඹුවේ ජාති ආගම් දේශපාලන පක්ෂ බේද ගං වතුරේම පා කර හරිමින් ය. ඒ ක්‍රියාවලිය ඉතාම ආදර්ශමත් එකක් වූවා පමණක් නොව ජාතික ආපදාවකදී ජාතියක් ලෙස එක්ව නැගී සිටීමෙන් බොහෝ දේ සාක්ෂාත් කර ගත හැකි බව පෙන්වා දුන් වැදගත් අවස්ථාවක් ද විය.

එසේ තිබියදී බොර දියේ මාලු බාන්නට සැරසුණවුන්ද දකින්නට ලැබීම කණගාටුවට කරුණකි. ජාතික ව්‍යසනයක් දේශපාලන වාසි ලබා ගන්නට යොදා ගන්නට දේශපාලනයෙන් අන්ධව සිටින මේ පහත් මිනිසුන් ගත් උත්සාහය ආරම්භයේදීම යටපත් වීම ජාතියක් වශයෙන් ශ්‍රී ලංකාව ලද ජයග්‍රහණයක්මය.

රට මුහුණ දෙන අලුත්ම ව්‍යසනය ශාලාව හමුදා කඳවුරේ ගින්නයි. ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වෙන බැවින් වැඩි දුර යමක් ප්‍රකාශ කිරීම අනුචිද වුව ද ශාලාව යුද හමුදා කඳවුරේ ගින්න සම්බන්ධයෙන් ද ජාතියක් ලෙස එක්ව මුහුණ දීමේ පිළිවෙතම අනුගමනය කරන්නට ජනතාව උත්සුකවන්නේ නම් ජාතික ආපදාවකදී නැගී සිටීමේ අභියෝගය ජයගන්නට ශ්‍රී ලංකාවට පහසුවෙන්ම හැකිවනු නිසැකය.

# ජාතිය ගොඩනැඟීමේ අභියෝගය

ශ්‍රීලාල් සෙනෙවිරත්න





**ජනවාරි 8 රටේ සිදුවූ දේශපාලන වෙනසට බලපෑ එක් ප්‍රධාන හේතුවක් වූයේද, එම වෙනසින් පසු බිහිවුණු නව පාලනය ජයගත යුතු අභියෝගයක් වූයේද ජාතිය ගොඩනැඟීම පිළිබඳ දීර්ඝ කාලක් තිස්සේ රට තුළ පවතින අසමර්ථතාවයයි. ජනවාරි 8 දේශපාලන වෙනසෙන් අපේක්ෂා කළ, එහෙත් මෙතෙක් ඉටු නොවුණු ජන අභිලාෂ අතරද එය ප්‍රමුඛය. ජාතිය ගොඩනැඟීමේ අභියෝගය පිළිබඳ ප්‍රමාණවත් සාකච්ජාවක් හෝ මේ මොහොතේ රට තුළ සිදු නොවීම කණගාටුදායකය. රාවය පුවත්පතේ පුරෝගාමී කර්තෘ වික්ටර් අයිවන් පසුගිය සතියේ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවැති උත්සවයකදී ජාතිය ගොඩනැඟීමේ අවුල පිළිබඳ දක්වන ලද මේ අදහස් දැනුම්වත් පුරවැසි සමාජයේ අවධානය සහ සංවාදයට විෂය විය යුතුය.**

### ලංකාව අසමත්වීම සහ ඉන්දියාව සමත්වීම

නූතන අර්ථයෙන් ජාතිය යනුවෙන් අදහස් කරන්නේ කිසියම් දේශයක ජීවත්වෙන, ඒ දේශය ගැන ඇතිකරගත් පොදු හැඟීමකින් හා බැඳීමකින් ක්‍රියා කරන, සමාන තත්ත්වයකට පත්කරනු ලැබූ, එම දේශයේ විවිධ වර්ගවලට හා කුලවලට අයත්, විවිධ ආගම් අදහන, විවිධ භාෂා කතාකරන, ඒ රටේ ජනයායි. නූතන ජාතික රාජ්‍යයන් පහල වීම හා එම රාජ්‍යයන්ගේ යහපැවැත්මට අයත් පරණ වැඩවසම් ක්‍රම බිඳ වැටීම්, ධනේශ්වර පරිවර්තනයට සමාන්තරව සිදු වූ ඓතිහාසික ක්‍රියාදාමයක් ලෙස සැලකිය හැකිය. යුරෝපයේ ධනේශ්වරය පහල වීම, පැවති වැඩවසම් ක්‍රමයේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධතා උත්සන්න වීම නිසා ඇති වූ ස්වභාවික පිපිරීමක ප්‍රතිඵලයක් ලෙස සැළකිය හැකිය.

එහෙත් ලංකාව වැනි යටත් විජිත රටවල ධනේශ්වර ක්‍රමය පහළ වූයේ ධනේශ්වර යටත් විජිත ක්‍රමයෙන් එල්ල වූ බලපෑමේ ප්‍රතිඵලයක් වශයෙනි. යුරෝපයේ පහල වූ ජාතික රාජ්‍යයන්ට සැලසුම් සහගතව ජාතීන් ගොඩනගා ගැනීමක් කිරීමට අවශ්‍ය නොවීය. එම රටවල ජාතික රාජ්‍යයන් පහල වීම සේම, ජාතීන් පහල වීම ද ශත වර්ෂ තුනකට ආසන්න  කාලයක් තිස්සේ ඇති වන මහා සිදුවීම් සහ ඒ ආශ්‍රයෙන් ඇතිවන පුනර්ජීවනය නිසා සිදුවන දෙයකි.

කතෝලික පල්ලියේ ඇති වූ මහා බෙදීම, දීර්ග කාලයක් දේව ධර්මයට තිබූ අති විශාල ආදිපත්‍ය බිඳ වැටීම, විද්‍යාවේ ඇති වූ මහා වර්ධනය, වැඩවසම් ක්‍රමයට එරෙහිව ඇති වූ මහා නැගිටීම, දේශපාලන දර්ශනය හා කලාව යන අංශවල ඇති වූ ප්‍රබෝධය, වැඩවසම් රාජාණ්ඩු ක්‍රමය බිඳවැටී මහජන නියෝජිතයන්ගෙන්

12 වන පිටට